# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2165/15 – 2020 මාර්තු 03 වැනි අඟහරුවාදා – 2020.03.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඕතර පත්තුව සුළු කොට්ඨාසයේ, අංක 82ඒ, තුල්හිරිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තුල්හිරිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක KE/WRK/2017/163 හා 2017.11.23 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර ‘A’ – මොන්රෝවියා වත්ත – ප්‍රමාණය: හෙක්. 0.2944 ක් පමණ**

උතුරට: මොන්රෝවියා වත්ත; නැගෙනහිරට: මොන්රෝවියා වත්ත සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ මොන්රෝවියා වත්ත; බටහිරට: මොන්රෝවියා වත්ත.

02. **කැබලි අක්ෂර ‘B’ – මොන්රෝවියා වත්ත – ප්‍රමාණය: හෙක්. 0.6436 ක් පමණ**

උතුරට: මාර්ගය; නැගෙනහිරට: මාර්ගය සහ මොන්රෝවියා වත්ත; දකුණට: මොන්රෝවියා වත්ත සහ මාර්ගය; බටහිරට: මාර්ගය.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2017/WS/96.
2020 ජනවාරි මස 04 වැනි දින.
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 – 720


1A – G 32139 – 21 (2020/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*